

# හඬන්නට ළංවූ වන අරණ මඩකඩ කැලේ නාච්චිමලේ

ලංකා සංචාරක මණ්ඩලයේ අධ්‍යක්ෂ
**යූ.පී.එස්. පතිරණ**

**ලෝකයේ සංවර්ධිත යැයි පිළිගැනෙන බොහෝ රටවල් සංවර්ධනය කරා එළඹ ඇත්තේ කිසිදු පිරිවැයක් නැතුවම නොවේ. සංවර්ධනය වෙනුවෙන් බොහෝ විට ඔවුන් කැප කර ඇත්තේ එම රටවල පැවති ස්වාභාවික පරිසරයයි.**

**මෙම දේශගුණික තත්ත්වයන් නිසාම මඩකඩ කැලේ නාච්චිමලේ නිතැතින් විශේෂ පරිසර පද්ධතියක් බිහිවී තිබේ. කෝස්, දෙල්, පුවක්, කිතුල්, ඉඳි ආදී ගස්ද, වටිනා ඖෂධ පැලෑටි රැසක් ද ආර්ථික වටිනාකමින් යුතු දැව ශාක රැසක් ද ඇතුළත් වනගහනය තුළ ශ්‍රී ලංකාවට ආවේනික ශාක විශේෂ 60 කට ආසන්න ප්‍රමාණයක් ද උඩවැඩියා විශේෂ 10 කට අධික ප්‍රමාණයක්ද, මීවන විශේෂ කිහිපයක් ද නිරීක්ෂණය කළ හැකිය.**

කාර්මික විප්ලවයේ ප්‍රතිඵලයක් වශයෙන් මහා පරිමාණයේ කර්මාන්ත ශාලා ඉදි කරනු ලැබුවේත් ස්වාභාවික පරිසරය කැප කරමිනි. තවමත් සංවර්ධනය ගැන සිහින දකිමින් ඉබි ගමනේ ඇදෙන ශ්‍රී ලංකාවේ එහි ස්වාභාවික පරිසරය මෙතෙක් විනාශ වී ඇත්තේ එබඳු සංවර්ධිත ක්‍රියාවලියක ප්‍රතිඵලයක් නිසාම නොවන බව සඳහන් කිරීමට සිදුවීම කනගාටුවට කරුණකි. පරිසරයේ වැදගත්ම පැතිකඩක් ලෙස සලකනු ලබන්නේ වන සම්පතය. වනාන්තරය යනු විවිධ ශාකයන්ට හා සත්ත්ව ප්‍රජාවන්ට වැදගත් වූ නිවහනක් පමණක් නොවේ. එය මුළු මහත් මානව වර්ගයාගේ පැවැත්ම උදෙසා මහඟු සේවාවක් සලසනු ලබන සතර මහා නිධානයක් වැන්නකි. ශ්‍රී ලංකාවේ සීඝ්‍ර ලෙස විනාශ වෙමින් පවතින වන විනාශයේ වේගය අනුව දැනට ඉතිරිවී ඇති අල්පයක් වූ වන ආවරණය මුළුමණින්ම අතුරුදන්වී යාමට වැඩි කාලයක් ගත නොවනු නිසැකය. මිනිසාගේ අනුවණකම නිසාම දැනටමත් මියැදෙන්නට අවසන් සුසුම් හෙළමින් පවතින සුන්දර වනපෙත් කිහිපයක් ද ශ්‍රී ලංකාවේ පවතින බව අමතක කළයුතු නොවේ. කොළඹට නුදුරින් බස්නාහිර පළාතේම පිහිටි සුන්දර මඩකඩ කැලේ පරිසර පද්ධතිය ද එබඳු අවාසනාවන්ත ඉරණමක එළිපත්තේ සිටින එක් වනපෙතක් බව මෙහිදී සඳහන් නොකරම බැරි තරම් ය.

පානදුර - රත්නපුර නැතහොත් හොරණ - රත්නපුර ප්‍රධාන මාර්ගයේ පිහිටි ඉංගිරිය නගරයේ සිට පාදුක්ක මාර්ගයේ සැතපුමක් පමණ ගිය විට හමුවන මහ ඉංගිරිය මංසන්දියෙන් දකුණු දෙසට දිවෙන කිණගහවිල මාර්ගයේ සැතපුම් දෙකකට පමණ ආසන්න දුරක් ගියතැන මඩකඩ කැලේ හමුවේ. මඩකඩ කැලේ වඩාත්ම ප්‍රකටව ඇත්තේ එහි පිහිටුවා ඇති ආරණ්‍ය සේනාසනය නිසාවෙනි. මෙම වනපෙතේ සුන්දරත්වය ඒ මැදින් ගලා බසින දෙල නිසා වඩාත් ඔප්නැංවී ඇත. නම්බපාන දෙල නමින් හැඳින්වෙන මෙම දෙල වර්තමානයේ වඩාත් ප්‍රකටව ඇත්තේ, නාච්චමලේ දෙල නමිනි. පෙර ඈත දිනයකදී මෙම දෙලේ වැටී ආච්චි කෙනෙකු මියගිය පුවතක් සිහිපත් කරමින් නාකි ආච්චි මලේ යන්න ව්‍යවහාරයේදී වෙනස්වී නාච්චිමලේ යනුවෙන් ජන වහරට එක්වී ඇති බව සැලකේ.

මඩකඩ ආරණ්‍ය සේනාසනය වෙත ඇදී එන බැතිමතුන් අතරත් දේශීය සංචාරකයන් අතරත් මඩකඩ කැලේ නාච්චිමලේ පරිසර පද්ධතිය වර්තමානයේ ඉතා ජනප්‍රිය සංචාරක ආකර්ෂණයක් බවට පත්වී තිබේ. නාච්චිමලේ දෙල නිකම්ම දියපහරක් නොව කුඩා සුන්දර දියඇලි වලින් ගහන ඉතා ආකර්ෂණීය දෙලකි.

නාච්චිමලේ දෙල පහර හරස් කරගත් විශාල ගල්තලා මෙන්ම දෙලේ ගමන් මග අවහිර කළ ගල් තලාවේ පුංචි ඉඩක් ඔස්සේ රිංගා ගොස් නවත් ගල් තලාවකින් පහළට කඩා හැලෙමින් මවන ඉතා සුන්දර කුඩා ඇල්ලක්ද, දෙල ඔස්සේ පහලට ඇවිදගෙන යද්දී හමුවේ. එපමණක් නොව නාන තටාකයක් සේ ජලය රැඳුනු හා මදක් ගැඹුරු දෙලෙහිම වූ විශාල ජලාශයක් හමුවේ. නාච්චිමලේ දෙලේ දියනෑම සඳහා අවට ගම්වලින් දිනපතා ඇදී එන ජනයාගෙන් දිවා කාලයේ කිසිදු අඩුවක් නොමැත.

ගල්පර අතරින් ගලා බසිමින් දෙල නංවන ශබ්දයක් දසතින් නැගෙන රැහැයියන්ගේ හා කුරුල්ලන්ගේ නිරන්තර සංගීතයත් පරදා මෙම හරිත වනපෙතෙහි තවුස්දම් රකින යෝගාවර භික්ෂූන් වහන්සේලා වැඩ වෙසෙන ආරණ්‍ය සේනාසනය මඩකඩ කැලේට නිතැතින් ශාන්ත භාවයක් එක්කරදී තිබේ.



මිලි මීටර් 3500 ත් 4500 ත් අතර සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනයක් ලබන මඩකඩ වනරක්ෂිතයේ සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය සෙල්සියස් අංශක 23ත් 33 අතර වෙනස් වේ.

මෙම දේශගුණික තත්ත්වයන් නිසාම මඩකඩ කැලේ නාච්චිමලේ නිතැතින් විශේෂ පරිසර පද්ධතියක් බිහිවී තිබේ. කොස්, දෙල්, පුවක්, කිතුල්, ඉඳි ආදී ගස්ද, වටිනා ඖෂධ පැලෑටි රැසක් ද ආර්ථික වටිනාකමින් යුතු දැව ශාක රැසක් ද ඇතුළත් වනගහනය තුළ ශ්‍රී ලංකාවට ආවේනික ශාක විශේෂ 60 කට ආසන්න ප්‍රමාණයක් ද උඩවැඩියා විශේෂ 10 කට අධික ප්‍රමාණයක්ද, මීවන විශේෂ කිහිපයක් ද නිරීක්ෂණය කළ හැකිය.

මෙම මඩකඩ කැලේ රක්ෂිතයට ආසන්නයේ පිහිටි දෙඹගස් කන්ද වනපෙතට හා සමානව ජෛව විවිධත්වය අතින් ඉතා ඉහළ මට්ටමක තැබිය හැකි මෙම වන රක්ෂිතය ඉතා දුර්ලභ ගනයේ සමනල විශේෂ හා මත්ස්‍ය විශේෂ කිහිපයකටද නිජබිම සලසාදී තිබේ. විශේෂයෙන් නාච්චිමලේ දෙල පාරේ සුලභව දැක බලාගත හැකි බුලත් හපයා, දෙපුල්ලියා හා ගල්මල් දණ්ඩියා දැනට වඳවීයාමේ තර්ජනයට ලක්වී ඇති මත්ස්‍ය විශේෂ අතරට ගැනේ. ශ්‍රී ලංකාවට ආවේනික පිනුම් කටුස්සා, කරමල්, බෝදිලිමා හා සර්ප හීරළුවාද මඩකඩ කැලයේ හමුවේ. මෙම පරිසර පද්ධතිය ශ්‍රී ලංකාවේ පක්ෂීන් නිරීක්ෂණය කිරීම සඳහා ද සුදුසු ක්ෂේම භූමියකි. ශ්‍රී ලංකාවට ආවේණික පක්ෂීන් විශේෂ 27 ත් අඩකට ආසන්න පක්ෂීන් සංඛ්‍යාවක්ද මෙහිදී නිරීක්ෂණය කළහැකි බව පැවසෙන අතර, හබන් කුකුලා, වලි කුකුලා, අළු ගිරවා, ගිරා මලිත්තා, අළු කැදැත්තා, හිස කළු කොණ්ඩයා, මූකලන් බස්සා සමග ඉතා දුර්ලභ ගනයේ පක්ෂි විශේෂයක් වන බට ඇටිකුකුලාද නිරීක්ෂණය කළහැකි ශ්‍රී ලංකාවේ වනාන්තර අතලොස්සෙන් එකක් ලෙසද මඩකඩ කැලේ නාච්චිමලේ සැලකේ.

කෙසේ වුවද, මෙම සුන්දර පරිසර පද්ධතියේ අනාගත පැවැත්ම උදෙසා දැනටමත් එල්ලවී ඇති තර්ජන ද මෙහිදී අමතක කළයුතු නොවේ. අතිශයින් සුන්දර වනගොමුවක්ව පැවති මඩකඩ කැලේ රක්ෂිතයට මුල්ම හා දරුණුම තර්ජනය එල්ලවූයේ 1970 ගණන් වලදී එවක බලයට පත් රජය විසින් ආරම්භ කරන ලද වගා සංග්‍රාමය තුළිනි. එවක අක්කර දහස් ගණනක් වසා පැතිරුණු මෙම වනපෙත දේශපාලකයන්ගේ අදූරදර්ශී ක්‍රියාකලාපය නිසා බලෙන් හෙලිපෙහෙලිවී අද වනවිට අක්කර 50 ක භූමි ප්‍රමාණයක් දක්වා හැකිළුනු වනපෙතක් බවට පත්වී තිබේ. මීට අමතරව විශේෂයෙන් සති අන්ත නිවාඩුදිනයන්හිදී නාච්චිමලේ දෙලේ නැම සඳහාත්, මඩකඩ කැලේ ස්වභාව සෞන්දර්යය නැරඹීම සඳහාත්, අවට ගම්මාන වලින් මෙන්ම කොළඹ වැනි දුර බැහැරින්ද විශාල වශයෙන් ඇදී එන දේශීයයන් නිසාද වර්තමානයේ මෙම පරිසර පද්ධතියට හානි රැසක් සිදුවන බවද නොරහසකි.

විශේෂයෙන් මෙම දෙලේ දිය නැමටත්, විනෝද වීමටත් පැමිණෙන බොහෝ තරුණ කොටස් දෙල මැද පිහිටි ගල්පර මතට නැග මත්පැන් පානය කර ශබ්ද ඝෝෂා පවත්වමින් මෙම පරිසරයේ නිහැඬිතාවය බිඳ දමනවා පමණක් නොව වෙරිමතින් හා තරුණ මදයෙන් ඔදවැඩී හිස් මත්පැන් බෝතල් ගල්පරවල ගසා කුඩුකර දැමීම සුලභ දසුනකි. වෙරි මතින් බමන මිනිසුන්ගේ නොමනා හැසිරීම් හා ආරවුල් මෙන්ම තරුණ පෙම්වතුන්ගේ අශෝභන හැසිරීම්ද විශේෂයෙන් මෙම සුන්දර පරිසරයේ චමත්කාරය විඳ දරා ගැනීමට පැමිණෙන වැඩිහිටියන් හා ළමයින්ටද මහත් අවහිරයක් වී තිබේ. මෙහිදී දෙලේ තිබෙන විවිධ හැඩයන්ගෙන් අලංකාරවූ ගල්කැට ඉවතට ගෙන යාමටත්, අවට තුරුලතා කඩා බිඳ දෙල පාරට දැමීමටත් කටයුතු කරන්නන්නිසාද මෙහි පාරිසරික තුල්‍යතාවයටද තර්ජනයක් එල්ලවී තිබේ. මීට අමතරව, පොලිතින්, ප්ලාස්ටික් බෝතල් වැනි ද්‍රව්‍ය මෙහිදී තැනින් තැන දමා යෑම නිසාද, දෙලේ මසුන් ඇල්ලීම සඳහා විවිධ විෂවර්ග භාවිතා කිරීම නිසාද මෙම පරිසරයට ආවේණික ශාක හා සත්ත්ව ප්‍රජාවගේ තිරසාර පැවතීමට ද එල්ලවී ඇත්තේ බලවත් තර්ජනයකි.

එබඳු තර්ජන හමුවේ මෙම සුන්දර පරිසර පද්ධතිය සුරැකීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ප්‍රාදේශීය සභාව, පොලීසිය, වනජීවී දෙපාර්තමේන්තුව ආදී රජයේ ආයතන සමග ප්‍රදේශයේ ගරුතර සංඝයාවහන්සේලා හා පරිසර සංවිධානද එක්වී උත්සාහයක් දැරුවද සිදුවෙමින් පවතින දැඩි පරිසර විනාශය හමුවේ තවදුරටත් ඔරොත්තු දිය නොහැකි අවසන් සුසුම් හෙලනා මඩකඩ කැලේ නාච්චිමලේ සුන්දර වන අරණ නූපන් පරපුර වෙනුවෙන් නව කොතෙක් කල් ඉතිරිව පවතීද යන්න පැවසිය හැක්කේ, හුදෙක් ප්‍රශ්නාර්ථයක් ද සමගය. ❑



